බුදුසරණ

Buddhist Era 2547 Medin Full Moon- Saturday , March 06 , 2004



බුදු බව ලද බුදු රජාණන් වහන්සේ බරනැසට වැඩම කළ අවස්ථාවේ පස්වග තවුසන් හමු වූ ස්ථානයේ ඉදිකර ඇති සම්මුඛ චෛත්‍යය

## ⁘ දිවි මඟ එළිය කරන භාවනාව

– දියසෙන්පුර විමල හිමි

ලෞකික හා ලෝකෝත්තර සාර්ථකත්වයට හේතු වන බෞද්ධ භාවනා ක්‍රමයේ විශේෂත්වය. භාවනාව තුළින් ජීවිතයේ යථා ස්වභාවය වටහා ගැනීම නිසා ඇති වන පෞරුෂ වර්ධනය – පුද්ගල සාර්ථකත්වයට හේතු වන අයුරු.

## ⁘ ඉසින්බැස්සගල රජමහා විහාරය

– කොරතොට විජේතුංග

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය ප්‍රදේශයේ පිහිටා ඇති ඉපැරැණි ඓතිහාසික විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු. ශ්‍රී ලංකාවට බුදුදහම රැගෙන වැඩම කළ මිහිඳු මාහිමියන්ගෙන් පළමුවෙන් දහම ඇසූ – එවකට මෙහි සිටි රාජ්‍ය පාලකයා වූ දේවානම්පියතිස්ස රජතුමා විසින් කරවන ලද’යි සැලකෙන විහාරස්ථානයකි, මෙය.

## ⁘ බුදුසමිඳු කිඹුල්වතට වැඩි මැදින් පොහොය අදයි

– කරව්වේ විජයතිස්ස නාහිමි

බුදුරදුන් තම උපන් ගම වූ කිඹුල්වත්පුරයට වැඩම කිරීම පිළිබඳ ඓතිහාසික තොරතුරු විමර්ශනයකි, මෙම ලිපිය. මැදින් පොහොය ද සිදුවූ සුවිශේෂ සිදුවීමක් ලෙසයි – බුදුරදුන්ගේ මෙම කිඹුල්වත්පුර ගමන ශාසන ඉතිහාසයේ සටහන් වන්නේ.

## ⁘ මාරයාගේ වසඟයට නොයන ක්‍රමය

– දිවියාගහ යසස්සි නා හිමි

‘සාර්ථක ජීවිතයකට ධම්මපදයෙන්’ විශේෂාංගය යටතේ පළවන කුඩා ලිපියකි. පස්කම් සැපත කෙරෙහි ඇති තණ්හාව නිසා සත්වයා දුකට පත්වන ආකාරයත් – මාර බන්ධනයෙන් මිදීම සඳහා පංචකාම තණ්හාව දුරුකිරීමේ අවශ්‍යතාවත් පෙන්වාදීමයි, මෙම ලේඛකයාගේ අරමුණ වී ඇත්තේ.

## ⁘ පාරමී ධර්ම තුළ ගැබ් වන අපරාජිත ජීව වේගය

– රෙජී වීරමන්

බුදුරජාණන්වහන්සේ – බෝධිසත්වවරයකු ලෙස පාරමී ධර්ම පූරන අවධියේ සිට – එම ප්‍රයත්නය නිසා උන්වහන්සේ තුළ ගොඩනැගුණු – කිසිවකුටත් පරාජය කළ නොහැකි වූ ආධ්‍යාත්මික ශක්තිය පිළිබඳ විමර්ශනයකි, මෙම ලිපිය.

## ⁘ සදහම් දැනුම

– වහුමුවේ විජයවංශ නා හිමි

බුදුදහම හා ඒ ආශ්‍රිත විවිධ විෂය කරුණු පිළිබඳ පාඨකයා දැනුවත් කරන – කෙටි ප්‍රශ්න හා පිළිතුරු ඇතුළත් විශේෂාංගයකි. විශේෂයෙන් දහම හදාරන සිසුන්ට මෙම විශේෂාංගය ප්‍රයෝජනවත් විය හැකිය.

## ⁘ ථෙරපුත්තාභය ආරණ්‍යය

– ජනක වෙත්තසිංහ

මොනරාගල දිස්ත්‍රික්කයේ බුත්තල – කුඹුක්කන ප්‍රදේශයේ පිහිටා ඇති සුන්දර වන සෙනසුනක් පිළිබඳ තොරතුරු, මෙවර ‘සිත් සනසන සෙනසුන’ විශේෂාංගයෙන්.

## ⁘ බොන්ජී ජපන් බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

– සේනපුර ඩී. නිශ්ශංක

අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් ඓතිහාසික මිහින්තලේ ප්‍රදේශයේ පිහිටා ඇති ශාසනික හා සමාජ සේවා රැසක් සිදුකරන බෞද්ධ ආයතනයක් පිළිබඳ තොරතුරු දැක්වෙන ලිපියකි.

## ⁘ The Buddha responds to His father’s request

-by Danister I. Fernando

## ඍ පරිසර සංරක්ෂණයට බුදුදහමෙන් ලැබෙන පිටිවහල

– කිරින්දේ විමලරතන හිමි

බුදුරදුන් පෙන්වා දී ඇති පරිසරයේ වටිනාකම දැක්වෙන දහම් කරුණු මිනිසා ඇතුළු ජීව ලෝකයේ පැවැත්ම සඳහා පරිසරය රැකගැනීමේ වැදගත්කම සහ ඒ සඳහා අවශ්‍ය විවිධ ක්‍රියාමාර්ග – දහම තුළින් උන්වහන්සේ පෙන්වා දී ඇති අයුරු.

## ඍ උතුම් මිනිස් ගුණ දම්

– උඩුවේ ධම්මාලෝක හිමි

බුදුදහමෙහි දැක්වෙන සතර බ්‍රහ්ම විහරණ මුල් කොට ගත් උතුම් මිනිස් ගුණ දහම් ප්‍රගුණ කිරීමෙහි වැදගත්කම. පුද්ගලයාගේ ද සමාජයේ ද සර්වාකාර ප්‍රගතිය සලසන බෞද්ධ ගුණ දහම් හා පිළිවෙත්වල වටිනාකම; ‘දියුණුවේ දොරටු’ විශේෂාංගය යටතේ.

## ඍ ලේක්හවුස් නිර්මාතෘ ජන්ම සමරුවෙන්